# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත

பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்

Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எமது இலக்கம் / My No | NWP/CS/F/1/1/2021 ගිණුම් පියවීම | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | දිනය / திகதி / Date: 2021.11.11 |

**පළාත් භාණ්ඩාගාර (ගිණුම් හා ගෙවීම්) චක්‍රලේඛ අංක 01/2021**

වයඹ පළාතේ සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

## 2021 වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම

පළාත් මූල්‍ය රීති 308 අනුව 2021 මුදල් වර්ෂයේ ගිණුම් පොත් 2021 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු අතර, 2021 වර්ෂයට මූල්‍ය ප්‍රකාශන, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම් කටයුතු වල අවසන් ගිණුම් 2022 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බැවින්, මෙම චක්‍රලේඛයේ 04 ඡේදයේ සඳහන් උපදෙස් තරයේ අනුගමනය කරමින් කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර, යම් ප්‍රමාදයක් සිදුවුවහොත් ඒ පිළිබඳ වගකීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් සහ ගණන්දීමේ නිලධාරින් වෙත පැවරෙන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**02.** පොදු කරුණු

**2.1** වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ (www.cs.nw.gov.lk) ඇතුළත් කර ඇති ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට අදාල මාසික පරිගණක වාර්තා පරීක්ෂා කර ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව වැය විෂයයන්ට කරන ලද හර කිරීම් ඇත්නම් ඒවා වහාම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

**2.2** පරිපූරක ගිණුම් සාරාංශ මඟින් වෙනත් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ගිණුම් වලට අදාල සටහන් යොදන අවස්ථාවලදී ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

**2.3** සාවද්‍ය ගිණුම් තැබීමක් නිවැරදි කිරිම සඳහා වන ජ'නල් සටහන් පළාත් භාණ්ඩාගාරයට යොමු නොකළ යුතු අතර, ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ CIGAS වැඩ සටහන මඟින් එම ගිණුම් සටහන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

**2.4** 2021 වර්ෂය සඳහා ඒ ඒ ආයතනයට අදාල අවසන් භාණ්ඩාගාර පරිගණක ගිණුම් ප්‍රකාශ නියමිත දින වලදී ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියට නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.


ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — Tel : 037-2228019, Fax : 037-2223777, e-mail : chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site :

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதம செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2228128, Fax : 037-2223731, e-mail : dcsfnnwpc@gmail.com